# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ 2171635
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல } 011-
Fax

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1600 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 18/10 /2024
පැය 0830

# මාධ්‍ය නිවේදනය

## 01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.

2024.10.16 වන දින ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ මාදම්පිටිය කනත්ත ඉදිරිපිට දී ත්‍රීරෝද රථයක සිටි පුද්ගලයෙකුට කාර් රථයකින් පැමිණි නාඳුනන පුද්ගලයෙකු විසින් වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය මඟින් විමර්ශන සිදු කර මෙම ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 45 හා 50 වයස්වල පසුවන කොළඹ 10 හා කොළඹ 15 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ඉහත සැකකරුවන් මෙම වෙඩි තැබීම සිදුවන අවස්ථාවේ මරණකරු සමඟ ත්‍රීරෝද රථයේ සිටි අනෙක් පුද්ගලයින් දෙදෙනා වන අතර, මොවුන් විසින් මරණකරුව නිවසේ සිට වෙඩිතැබීම සිදු වූ ස්ථානයට ත්‍රීරෝද රථයෙන් රැගෙන ගොස් ඇති බවත්, සැකකරුවන් සමඟ දුරකථනයෙන් සම්බන්ධ වී මෙම ඝාතනයට ආධාර අනුබල දී ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.10.17 වන දින දහවල් කාලයේ බොරැල්ල පොලිස් වසමේ බේස්ලයින් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 520 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන කොළඹ 08 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාරාහේන්පිට පොලිස් ස්ථානය.**

2024.10.17 වන දින සවස් කාලයේ නාරාහේන්පිට පොලිස් වසමේ කිතුල්වත්ත ප්‍රදේශයේදී නාරාහේන්පිට පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලි ග්‍රෑම් 404 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ කොස්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

නාරාහේන්පිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - මහියංගනය පොලිස් ස්ථානය.**

2024.10.17 වන දින සවස් කාලයේ දිවුලපැලැස්ස පොලිස් වසමේ රොටලවෙල ප්‍රදේශයේදී මහියංගනය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු කැණීම් උපකරණද සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34, 40, 42 හා 45 වයස්වල පසුවන දිවුලපැලැස්ස හා ගිරාඳුරුකොට්ටේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මහියංගනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **වන අලි පහරදීමකින් පුද්ගලයෙකු මියයාම - වනාතවිල්ලුව පොලිස් වසම.**

2024.10.17 වන දින රාත්‍රී කාලයේ වනාතවිල්ලුව පොලිස් වසමේ එළුවන්කුලම ප්‍රදේශයේ වන අලි පහරදීමක් හේතුවෙන් පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට වනාතවිල්ලුව පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය කැළෑබද ප්‍රදේශයක තිබී හමු වී ඇති අතර මොහු එම ප්‍රදේශයේ වත්තක මුරකරු ලෙස කටයුතු කර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වනාතවිල්ලුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**